## ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2015

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල පාඨමාලා ගාස්තු ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බවට හෙළිදරව් කිරීම් කර ඇතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඨමාලා ගාස්තු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදෙන ප්‍රදානයන් අයභාර ප්‍රදානයන් ලෙස මූල්‍ය කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කිරීමේ ප්‍රතිපත්තිය දිගින් දිගටම අනුගමනය කර තිබුණි. එම නිසා ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කරගෙන අත්පත් කර ගත් රු.904,772 ක ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය නොවන අතර ඒ මත ක්ෂයවීම් ගිණුම් ගතකර නොතිබීම, ප්‍රාග්ධන ප්‍රදාන රු.3,191,793 ක් අයභාර වියදම් දැරීම සඳහා උපයෝගී කරගෙන තිබීම හා උපයෝජනය නොකරන ලද රු.2,694,865 ක් වර්ෂයේ ලාභයට ඇතුළත් වීම යනාදී ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

ආයතනයේ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් සඳහා සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ගෙවීම් හා උපචිත වියදම් එකතුව රු.445,147 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.487,069 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.41,992 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

2014 වර්ෂයේ උපචිත සංග්‍රහ වියදම් රු.62,000 ක් සමාලෝචිත වර්ෂයේදී ද පියවීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 177(1) | එකතු කරනු ලබන මුදල් දිනපතාම හෝ හැකිතාක් ඉක්මනින් බැංකුගත කළයුතු වුවත්, බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ පාඨමාලා ගාස්තු ආදායම බැංකුගත කිරීමේදී දින 03 සිට දින 50 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදවීම් නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 341(1) | භාවිතා කරනු ලබන උප පත්‍රිකා පොත් ලැබීම් හා ඒ සම්බන්ධ කටයුතු සටහන් කිරීම සඳහා ආයතනය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාර ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | අත්තිකාරම් දෙන ලද කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත්, බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරී වෙත අවස්ථා 03 කදී ලබාදී තිබූ රු.380,000 ක අත්තිකාරම් පියවීමේදී ලබාගත් මුදලින් සියයට 70 සිට සියයට 90 දක්වා පරාසයක් දින 06 සිට දින 24 ක් දක්වා අත රඳවා ගෙන පියවා තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනය හා බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.13,410,412 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 9.3.1 වගන්තිය | ආයතනයේ අනුමත තනතුරු සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,490,821 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,339,517 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,151,304 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වෙනත් ආදායම් රු.4,694,690 කින් අඩුවීම හා සැපයුම් හා පාරිභෝජන වියදම රු.2,788,831 කින් වැඩිවීමක් සිදු වුවද, කාර්ය මණ්ඩල වියදම රු.2,346,923 කින් හා වෙනත් වියදම් රු.5,013,781 කින් අඩුවීම සහ

පාඨමාලා ගාස්තු ආදායම රු.5,018,871 කින් වැඩිවීම අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී මූල්‍ය ඌනතාවයක් ලබා තිබුණද ඉන් පසු වර්ෂ වලදී අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේදී රු.3,308,884 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.16,640,237 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

(අ) 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන (සංශෝධන) පනතේ 05 වගන්තිය ප්‍රකාරව ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, නීතිය, ආර්ථික විද්‍යාව, සංස්කෘතික සම්බන්ධතා, කෘෂිකර්මය සහ පරිසරයට අදාල තොරතුරු ඇතුළු ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපාය මාර්ග අධ්‍යයනයන්ට අදාළ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සහ ව්‍යුහගත කිරීම සඳහා වූ තොරතුරු හා දත්ත රජයට සැපයීම.

- උපාය මාර්ග අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ පර්යේෂණවලට හා අධ්‍යයනවලට ආධාර කිරීම හා ඒ භාරගන්නා තැනැත්තන් පුහුණු කිරීම.

- ශ්‍රී ලංකාවට අදාළ වන උපාය මාර්ග අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා කිරීම, විශ්ලේෂණය කිරීම සහ ඇගයීම සඳහා පසුතලයක් සලසා දීම සඳහා කලාපය තුල සහ ජාත්‍යන්තර වශයෙන් ඒකාබද්ධ අධ්‍යයනයන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

- උපාය මාර්ග අධ්‍යනයන්ට සහ ජාත්‍යන්තර සම්බන්ධතාවලට කැපවී ඇති පුස්තකාලයක් ඇතුළු තොරතුරු ගබඩාවක් පිහිටුවීම.

- විෂයපථයට ගැනෙන කරුණුවලට අදාළ වාර සඟරා හා ලිපි පළ කිරීම.

- ශ්‍රී ලංකාව මෙන්ම වෙනත් රටවල ද සමාන අරමුණු සහිත පුද්ගලයන්, සංවිධාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධතා හා මිත්‍රත්වයක් පවත්වාගෙන යාම.

- රාජ්‍යතාන්ත්‍රික කටයුතු ජාත්‍යන්තර සම්බන්ධතා සහ මණ්ඩලය විසින් උචිත යයි සලකන වෙනත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී උපාය මාර්ග අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ දේශන 05 ක් හා සාකච්ඡා 07 ක් පමණක් පවත්වා තිබුණි. එමගින් ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ප්‍රමාණාත්මක දායකත්වයක් දක්වා තිබූ බව තහවුරු නොවුණි.

(ආ) පනතේ 10 (ඉ) වගන්තිය ප්‍රකාරව බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ කර්තව්‍යයන් ලෙස පුහුණු වැඩසටහන් සහ වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සඳහා

වගකිව යුතු ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු අතර එසේ ක්‍රියාත්මක කරනු ලැබූ පුහුණු වැඩසටහන් සහ වෙනත් අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධ්‍යයන පරිපාටියෙහි සඳහන් පරිදි රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරීමට සුදුසුකම් වශයෙන් නම් කර ඇත්තේ උපාධිධාරීන්, වෘත්තිකයින්, රජයේ හා පුද්ගලික අංශයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් හා විදේශ සේවයට ඇතුළත්වීමට අපේක්ෂිත අයට පමණක් වුවත් අ.පො.ස. උසස් පෙළ සමතුන් 22 ක් සහ අ.පො.ස. සා.පෙළ සමත් එක් ශිෂ්‍යයෙක් සමාලෝචිත වර්ෂයේදී ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගෙන තිබුණි.

(ii) 2015 වර්ෂයේ ආරම්භ කළ රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව මාලදිවයින් තානාපති කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකුට සහ අමාත්‍යාංශ නිලධාරීන් 07 දෙනෙකුටද රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 03 දෙනෙකුටද ගාස්තු ගෙවීමකින් තොරව හැදෑරීමට වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් අවසර ලබා දී තිබූ නමුත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) ආයතනය විසින් රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2013 වර්ෂයෙන් පසුව පවත්වා නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 05 ක් ප්‍රමාදවී 2016 අගෝස්තු මස 01 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබූ බැවින් පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් කාර්යසාධනය සමඟ සැසඳීම් කිරීමේ හැකියාවක් නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ (ඈ) ප්‍රකාරව ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂය සඳහා සනීපාරක්ෂක සේවා හා උද්‍යානය නඩත්තු යන කාර්යයන් දෙක සම්බන්ධව සැපයුම් ගිවිසුම්වලට ඇතුළත් නොවී රු.1,260,000 ක මුදලක් ගෙවා තිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ආයතනය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයෙන් ද විගණනයක් සිදු කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනවල ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමට හා පාලන කාරකයක් ලෙස යොදාගැනීම සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වෙත වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | පුස්තකාල පාලනය | (i) බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ පරිග්‍රහන ලේඛනයේ අංකය පොත්වල සටහන් කර නොතිබීම.<br>(ii) ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ පරිග්‍රහණ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ආ) | පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් | රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව සඳහා නිසි අයුරින් සම්පූර්ණ නොකර අඩුපාඩුකම් සහිතව ලැබී තිබුණු අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හෝ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමකින් තොරව සිසුන්ට පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබාදී තිබීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම. |
| (ඈ) | වියදම් පාලනය | බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් අතිකාල ගෙවීමේදී ඉටුකළ කාර්යයන් සඳහන් කර නොතිබීම හා අත්තිකාරම් ගෙවීමේදී අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබීම. |